We Deliver Results....

Susantha Katugampala
Barrister & Solicitor
*Immigration Lawyer*
*Migration Agent Reg: 96/86306*

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

Tel : (03) 9650 4557 Fax : (03) 9650 4559
10 Morrison Place East Melbourne 3002

කිරීමට දියඹට ගොස් තිබේ.

ඔවුන් ප්‍රථමයෙන්ම බෝට්ටු දෙකක් පරීක්ෂා කර ඇතත්, ඉන් කිසිදු සැක තත්ත්වයක් දැක නැත. ඒවා මුහුදේ මසුන් මැරීමේ යෙදී සිටි ධීවරයන් පිරිසක් රැගත් බෝට්ටු දෙකකි. ඊට නුදුරින් තවත් බෝට්ටු කිහිපයක් තිබී ඇත. ඒවා පරීක්ෂා කිරීම සඳහා ඉදිරියට ඇදෙන විට එක්වරම ඒවායෙන් නාවික හමුදාවට ප්‍රහාරයක් එල්ල වී තිබේ.

දෙපාර්ශවය අතර පැය දෙකකට ආසන්න කාලයක් බරපතල ගැටුම් පැවැතිණි. කොටි බෝට්ටු 12 ක් පමණ එක්වරම නාවික හමුදාවේ ඩිංගි බෝට්ටු තුනට නොකඩවා එල්ල කළ ප්‍රහාරවලින් ගැලවී යෑමට හෝ බේරීමට නාවික භටයන්ට හැකියාව ලැබුණේ නැත. එය අතිබිහිසුණු ප්‍රහාරයක් විය. ප්‍රහාරයෙන් නාවික බෝට්ටු තුන මුළුමණින්ම විනාශයට පත්විය. ඒවායේ සිටි නාවික භටයන් 11 දෙනකු අතුරුදහන් වූ අතර තිදෙනකුගේ මළ සිරුරු පසුව හමුවිය. ආධාරක බෝට්ටුවල සහයෝගය ඇතිව කොටි එල්ල කළ ප්‍රහාරක උණ්ඩ 100 ක් පමණ එක් ඩිංගි බෝට්ටුවකට වැදී ඇත.

එමඟින් නාවික බෝට්ටු තුන දියඹේ නොපෙනී ගොස් ඇත. පසුව කිමිදුම්කරුවන් යොදා මුහුදේ කරන ලද සෝදිසියක දී බෝට්ටු දෙකක කොටස් හමු වී ඇත. ඒවා නාවික හමුදා ප්‍රහාරවලින් විනාශයට පත් මුහුදු කොටින්ගේ බෝට්ටු බව රජයේ ආරක්ෂක අංශ පවසයි.

නමුත් දැනගන්නට ඇති ආකාරයට ඒවා කොටි බෝට්ටු නොව, කොටි ප්‍රහාරවලින් විනාශයට පත් නාවිකා හමුදාවේ ඩිංගි බෝට්ටු තුනෙන් දෙකක කොටස් ය. විනාශයට පත් අනෙක් ඩිංගි බෝට්ටුව ගැන මේ වනතුරුත් කිසිදු තොරතුරක් නැත.

නාවික හමුදාව හා මුහුදු කොටි බලකාය අතර පේසාලේ ඇති වූ ගැටුමෙන් මුහුදු කොටි 25-30 ත් අතර සංඛ්‍යාවක් මියගිය බව හමුදා ප්‍රකාශක බ්‍රිගේඩියර් ප්‍රසාද් සමරසිංහ මහතා පවසයි. නමුත් කොටි එය ප්‍රතික්ෂේප කරති. ඔවුන් ප්‍රකාශ කරන්නේ ප්‍රහාරයෙන් තමන්ගේ සිව් දෙනෙකු පමණක් තුවාල ලැබූ බව ය.

ප්‍රහාරයෙන් අනතුරුව පේසාලේ මුහුදු තීරයේ නාවික හමුදාව කිමිදුම්කරුවන්ගේ සහයෝගය ඇතිව පූර්ණ මෙහෙයුමක් දියත් කළත්, ඉන් කොටින්ගේ කිසිඳු මළ සිරුරක් හෝ විනාශයට පත් බෝට්ටු කිසිවක් හමුවී නැත. එමඟින් ප්‍රහාරයෙන් කොටින්ට සිදුවූ අලාභය ඉතාම අවම බව පෙනේ.

ප්‍රහාරය සිදුවන අවස්ථාවේ නාවික ලුතිනන් දළුගමගේ නාවික හමුදාවේ හා ගුවන් හමුදාවේ සහයෝගය ඉල්ලා සංඥා නිකුත් කර ඇත. නමුත් සැලකිය යුතු ප්‍රතිඵලයක් ලැබී නැත. ප්‍රතිප්‍රහාර සඳහා නාවික හමුදාවේ කිසිදු ඩෝරා යාත්‍රාවක් පැමිණ නැත. ප්‍රහාරය සඳහා තලෙයිමන්නාරම මුහුදු තීරය හරහා නාවික ඩිංගි බෝට්ටු 4 ක් පමණ පැමිණ ඇත.

මීට එක් හේතුවක් නම්, මන්නාරම ප්‍රදේශයේ ඩෝරා යාත්‍රා නවතා තබා ගැනීමට තරම් ආරක්ෂක ස්ථානයක් නාවික හමුදාවට නැති වීමයි. මේ නිසා සුරක්ෂිතව ඩෝරා යාත්‍රා නවතා තැබෙන්නේ යාපනය, කන්කසන්තුරේ නාවික තටාකාංගනයේය. එහි සිට මන්නාරමට ඩෝරා යාත්‍රාවක් පැමිණීමට පැයක් පමණ ගතවනු ඇත. මේ ස්වභාවය මත පේසාලේ සිදු වූ නාවික කොටි ගැටුමේදී ඩෝරා යාත්‍රාවලට පැමිණීමට නොහැකි වී ඇත.

ගුවන් හමුදාවේ සහාය ඉල්ලා ඇතත්, එයත් නිසි පරිදි සිදු වී නැත. ගුවන් හමුදා ප්‍රහාරක යාත්‍රා පැමිණ ඇත්තේ ප්‍රහාරය සිදු වී බොහෝ වේලාවකට පසුවය. එහෙත් කොටින්ට එරෙහිව ගුවන් ප්‍රහාර සිදු වී ඇති බවක් පෙනෙන්නට නැත. ප්‍රහාරක මුහුදු කොටි නාවික හමුදාවේ ඩිංගි බෝට්ටුවල සවිකර තිබූ එම්.පී.එම්.ජී. වර්ගයේ අධි බලැති ප්‍රහාරක තුවක්කු දෙකක් පැහැරගෙන ගොස් ඇත. ඒවායෙන් මීටර් 1200 ක් පමණ දුරකට ප්‍රහාර එල්ල කිරීමේ හැකියාව ඇත.

මන්නාරම පේසාල මුහුදු තීරයේ නාවික හමුදාව හා මුහුදු කොටි බලකාය අතර පැය දෙකකට ආසන්න කාලයක් පැවැති සටනේදී ගොඩබිම සිටි නාවික හමුදාවත් යුද හමුදාවත් පොලිස් භටයිනුත් තමන්ට හැකි ආකාරයට කොටින්ට ප්‍රතිප්‍රහාර එල්ල කර ඇත. දෙපාර්ශවය අතර නිමක් නොමැතිව එල්ල වූ ප්‍රහාර පේසාලේ ශාන්ත මරියා දේවස්ථානයට ද එල්ල විය. එම දේවස්ථානය ''ජයග්‍රහණයේ අපේ මාතාව'' යන නාමයෙන් ද හඳුන්වනු ලැබේ. දේවස්ථානයට එල්ල වූ ප්‍රහාරවලින් එහි සිටි පස් දෙනෙකු මියගොස් තවත් 44 දෙනකු තුවාල ලබා ඇත. මියගිය අය අතර මන්නාරම කට්ටස්පත්තිරි ප්‍රදේශයේ පදිංචි ධීවරයන් සිව් දෙනෙක් වූහ. තිදරු පියෙකු වන තුරෙයිරාජා විජේකුමාර්, සිව්දරු පියකු වන අබ්දුල් රහුමාන් ලතීෆ් විඩත්තල්තීවු හි සිරිල් අප්පා සෙන් ජූඩ්, ජේසුදාසන් ජූඩ් නික්සන් යන අයත් පේසාල 4 ජනපදයේ පදිංචි 70 හැවිරිදි මැනුවෙල් ක්ලාරා අම්මා යන කාන්තාවන් ය. ප්‍රහාරය එල්ල වන දින දේවස්ථානය තුළ විවාහවීමට තරුණ ජෝඩු තුනක් සුදානමින් සිටි ඇත. ඒ අතර මියගිය මැනුවෙල් ක්ලාරා අම්මාගේ මිනිපිරිය ද වූවා ය.

මීට අමතරව පේසාලේ මුහුදු වෙරළේ බෝට්ටු දෙකක තිබී තරුණ මළ සිරුරු දෙකක් හමුවී ඇත. ඉන් එකක් 20 හැවිරිදි දෙමළ තරුණයකු වන කුඩාලිංගම් ලිංගනාදන් නමැත්තාගේ ය. අනෙක් මළ සිරුර හඳුනාගත නොහැකි ආකාරයට පිළිස්සී තිබිණි. පේසාලේ ප්‍රදේශයෙන් තරුණයන් තිදෙනෙකු අතුරුදහන් වී ඇති අතර ඔවුන්ට

*මන්නාරම පේසාල මුහුදු තීරයේ නාවික හමුදාව හා මුහුදු කොටි බලකාය අතර පැය දෙකකට ආසන්න කාලයක් පැවැති සටනේදී ගොඩබිම සිටි නාවික හමුදාවත් යුද හමුදාවත් පොලිස් භටයිනුත් තමන්ට හැකි ආකාරයට කොටින්ට ප්‍රතිප්‍රහාර එල්ල කර ඇත.*

සිදුවූයේ කුමක්ද යන්න මේ වනතුරුත් කිසිදු තොරතුරක් නැත.

පේසාලේ නාවික කොටි ගැටුමෙන් අනතුරුව කිසියම් පිරිසක් වෙනකල්ලයිපාඩු ධීවර ගම්මානයේ පැල්පත් 73 ක් පමණ ගිනි තබා විනාශ කර ඇත. එහි තිබූ බෝට්ටු තුනක් සම්පූර්ණයෙන් විනාශ වී ඇති අතර තවත් බෝට්ටු 15 ක් පමණ සුළු වශයෙන් ගිනි ගෙන තිබේ. ගින්නෙන් කුඩා සිනමා ශාලාවක්, වෙළෙඳසැල් දෙකක්, විදුලි මෝටර් 90 ක් හා රුපියල් ලක්ෂ 10 ක් පමණ වටිනා ධීවර මුදල් විනාශ වී ඇත. පේසාලේ පැල්පත් 25 ක් හා බෝට්ටු 40 ක්ද ගිනි තබා තිබේ.

මේ සියලු දේවල් නාවික හමුදාව මඟින් කළ බව විල්සන්ට් පැට්‍රික් පියතුමා ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුවේ තෝර්ෆන්නූර් ඔමාර්ස්සන් මහතාට පැමිණිලි කර ඇත. නමුත් ඒ සියලු චෝදනා නාවික හමුදාව ප්‍රතික්ෂේප කර සිටී. රායප්පු ජෝශප් මන්නාරම රදගුරුතුමා ප්‍රකාශ කරන්නේ නිල්පාට ඇඳුම් ඇඳගෙන මුහුණ වසාගත් පිරිසක් දේවස්ථානයට කඩා වැදී අත්බෝම්බ ප්‍රහාර දෙකක් එල්ල කිරීම නිසා එහි සිටි පස්දෙනෙක් මියගොස් තවත් 44 දෙනකු තුවාල ලැබූ බවය.

ශ්‍රී ලංකා නාවික හමුදාවේ මාධ්‍ය ප්‍රකාශක කොමදෝරු ජයන්ත දසනායක මහතා ප්‍රකාශ කරන්නේ කොටි සංවිධානය දේවස්ථානය ඉලක්ක කරගෙන ග්‍රෙනේඩ් ලෝන්චර්ස් මඟින් එල්ල කළ බෝම්බයක් පිපිරී මෙම අනතුර සිදු වී ඇති බව ය. නාවික හමුදාවේ සිව් දෙනෙක් දේවස්ථානයට කඩාවැදී අත්බෝම්බ ප්‍රහාරයක් එල්ල කර වෙඩි වරුසාවක් එල්ල කළ නිසා මේ මහා විපත සිදු වූ බව කොටි සංවිධානයේ මන්නාරම දේශපාලන අංශ නායක එස්. ඉනියවන් ප්‍රකාශ කරයි.

මේ පිළිබඳ සාකච්ඡාවක් එදින පේසාලේ දී පැවැත්විණි. එයට දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී විනෝ හරතලිංගම්, මන්නාරම නාවුක හමුදා අණදෙන නිලධාරී හා පියතුමන්ලා ඇතුළු කිහිපදෙනෙක්